# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 14,600 — 1965 දෙසැම්බර් 30 වැනි බ්‍රහස්පතින්ද — 1965.12.30**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**එල්.ඩී.—බී. 60/52.**

**තානායම් පනත**

තානායම් පණතේ (275 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිතුමා කළ නියෝගය.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 දෙසැම්බර් මස 29 දින,
කොළඹ දී ය.

**නියෝගය**

1966 ජනවාරි මස පළමුවැනි දින සිට යාපනය තානායම, යාපනය පාළන දිස්ත්‍රික්කයේ දිසාපතිගේ පාලනයට මාරුකර මෙයින් පවරනු ලැබේ.

**12–1672**

---

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**එල්.ඩී.—බී. 84/50.**

**මුදල් නීති පනත**

මුදල් නීති පනතේ (422 වැනි පරිච්ඡේදය) 10 (ඇ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද රෙගුලාසිය.

වී. රාජපතිරාන,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1965 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ.

**රෙගුලාසිය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලදුව, 1950 අගෝස්තු මස 28 වැනි දින අංක 10,143 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කොට, 1954 අප්‍රේල් 30 වැනි දින අංක 10,666 දරන ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසියෙන් අවසාන වරට සංශෝධිත 'අ' රෙගුලාසිය, 1966 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත දැක්වෙන අයුරින් වැඩි දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම රෙගුලාසියේ (1) වැනි ඡේදයේ—

(අ) එම ඡේදයේ (අ) අනුඡේදයේ ''සෙනසුරාද හෝ ඉරිද හෝ බැංකු නිවාඩු දින හෝ හැර'' යන වචන වෙනුවට ''බැංකු නිවාඩු දිනයක් හෝ පෝය දිනයක් හෝ පෝය දිනයට පෙර දිනය'' යන වචන ආදේශ කිරීමෙන්, සහ

(ආ) එම ඡේදයේ (ආ) අනුඡේදයේ ''සෙනසුරාද දිනයක්'' යන වචන වලට ''පෝය දිනයට ඉක්බිතිව වූ පෙර දිනය'' යන වචන ආදේශ කිරීමෙන්, සහ

(2) එහි 2 වැනි ඡේදයේ ''බැංකු නිවාඩු දිනය'' පිළිබඳ අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන නව අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්:—

''පෝය දිනය'' යන්නට, 1965 අංක 17 දරන නිවාඩු පනතේ දැක්වෙන තේරුම ම, විය යුතුය.

**12–1664**

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

1835——ආර් 11255—6,875 (65/12)